# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2115/45 - 2019 මාර්තු මස 22 වැනි සිකුරාදා - 2019.03.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XVI)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2019 මාර්තු මස 21 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2019 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට බලාත්මක විය යුතු ය.

2. 2018 පෙබරවාරි මස 23 වන දින අංක 2059/53 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමාවලිය මගින් අවසන්වරට සංශෝධිත පරිදි වූ, 1980 අප්‍රේල් මස 10 වන දින අංක 83/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 6 වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"6. ආයතනයේ නිලධරයන් පහත දක්වෙන පරිදි විය යුතු ය :-

(අ) (මෙහි මින්මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ අධ්‍යක්ෂවරයා ;
(ආ) (මෙහි මින්මතු "නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ; සහ
(ඇ) මෙම ඡේදයේ කාර්යය සඳහා, නියමාවලිය මගින් ප්‍රකාශයට පත් කර ඇති වෙනත් යම් තනතුරක් දරනු ලබන්නෙක්." ; සහ

(2) එහි 10 වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

''10. (1) (මෙහි මින්මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන කළමනාකරණ මණ්ඩලය ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය විය යුතු අතර, එය පහත තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත් වන සාමාජිකයන් :-

(i) අධ්‍යක්ෂවරයා ;
(ii) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;
(iii) උසස් අධ්‍යාපන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ නාමිකයකු ;
(iv) සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ නාමිකයකු ;
(v) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ නාමිකයකු ;
(vi) (මෙහි මින්මතු ''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ආ) පහත දැක්වෙන අනෙකුත් සාමාජිකයන් :-

(i) පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලවල, වෛද්‍ය, වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා යන එක් එක් පීඨයේ, නිත්‍ය සේවක ගණයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන් සහ සහය මහාචාර්යවරයන් අතරින් ඒ එක් එක් පීඨයේ පීඨ මණ්ඩලය විසින් තෝරා පත් කරගනු ලැබූවන්ගෙන් එක් පීඨයකින් එක් සාමාජිකයකු බැගින් වන ලෙස නම් කරනු ලබන සාමාජිකයන් ;

(ii) පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලවල, දන්ත වෛද්‍ය පීඨයන්හි, නිත්‍ය සේවක ගණයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන් සහ සහය මහාචාර්යවරයන් අතරින් ඒ එක් එක් පීඨයේ පීඨ මණ්ඩලය විසින් තෝරා පත් කරගනු ලැබූවන්ගෙන් එක් පීඨයකින් එක් සාමාජිකයකු බැගින් වන ලෙස නම් කරනු ලබන සාමාජිකයන් ;

(iii) කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල පාලන සභාවට පත් කරනු ලබන සාමාජිකයන් අතරින් පාලක සභාව නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු ; සහ

(iv) අධ්‍යාපන, වෘත්තීමය, වාණිජ, කාර්මික, නීති, විද්‍යාත්මක හෝ පරිපාලන ක්ෂේත්‍රයන්හි විශිෂ්ට සේවාවක් ඉටුකර ඇති තැනැත්තන් අතරින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් හත් දෙනෙකු.

(2) මණ්ඩලය විසින් සාකච්ඡාවට බඳුන් කළ හැකි යම් නිශ්චිත කාර්යයක් හා සම්බන්ධිත විශේෂ ක්ෂේත්‍රයක දැනුම හා පළපුරුද්ද ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් නිශ්චිත කාලසීමාවක් සඳහා මණ්ඩලයට අනුයුක්ත කර ගත හැකි ය. එලෙස අනුයුක්ත කර ගනු ලබන කිසිම තැනැත්තකු මණ්ඩලයේ සාමාජිකයකු නොවන අතර, මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලබන කිසිම කාරණයක දී ඒ සඳහා ඡන්දය දීමට අයිතිවාසිකමක් නොමැති නමුත් මණ්ඩලය විසින් ඉල්ලා සිටින අවස්ථාවල දී එහි රැස්වීම් සඳහා සහභාගී විය යුතු ය.''

04 - 137

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.